10918

AL/2020/51/S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ..................................

| පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණයි. | |
|---|---|
| I පත්‍රය සඳහා | |
| කොටස | ලකුණු |
| I | |
| II | |
| එකතුව | |
| 1 වැනි පරීක්ෂක | 2 වැනි පරීක්ෂක |

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

**I කොටස**

- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **තිත් ඉර මත** ලියන්න.

**II කොටස**

- අනුකොටස් **තුනකින්** සමන්විත ය. **'අ'** කොටසින් ප්‍රශ්න දෙකක් හා **'ආ'** සහ **'ඉ'** යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

* **I** කොටසට හා **II** කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

## I කොටස

- ප්‍රශ්න අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නවලට **වඩාත් නිවැරදි පිළිතුර** තෝරන්න.

**1.** ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර අතර උත්කීරණ ක්‍රමය අනුව සිත්තම් කර ඇති 'ඇතා සහ පැටියා' සිතුවම දක්නට ලැබෙනුයේ,

(1) තන්තිරිමලේ ගුහාවෙහි ය.
(2) බටදොඹ ලෙනෙහි ය.
(3) දොරවක ලෙනෙහි ය.
(4) බිල්ලෑව ගුහාවෙහි ය.
(5) වෙට්ටම්බුගල ගුහාවෙහි ය. (.........)

**2.** 'බුදුන් වහන්සේට තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් විසින් විළඳ මී පිඩු පූජා කෙරෙන සිතුවම' දක්නට ඇත්තේ,

(1) දිඹුලාගල මාරාවීදිය ලෙන් තුළ ය.
(2) මහියංගනය ස්ථූප චිත්‍ර අතර ය.
(3) පුල්ලිගොඩ ලෙන් චිත්‍ර අතර ය.
(4) හිඳගල ලෙන් බිත්තියේ ය.
(5) ගොනාගොල්ල ලෙනෙහි ය. (.........)

**3.** වර්ෂ 1891 දී ශ්‍රී ලංකාවේ කලා සංගමය ආරම්භ කිරීමේ අරමුණ වූයේ,

(1) අමූර්තවාදී සංකල්ප ප්‍රචලිත කිරීමයි.
(2) සාම්ප්‍රදායික දේශීය චිත්‍ර කලාව ආරක්ෂා කර ගැනීමයි.
(3) වියුක්තරූපී සංරචන විධි හඳුන්වා දීමයි.
(4) ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී චිත්‍ර ක්‍රමය ප්‍රචලිත කිරීමයි.
(5) සනිකවාදී ශිල්පක්‍රම හඳුන්වා දීමයි. (.........)

[දෙවැනි පිටුව බලන්න.

**4.** භාරතයේ 'මෞර්ය' යුගයේ ඉදි වූ නිර්මාණශීලීත්වයෙන් අනූන ස්ථම්භ ශීර්ෂය සේ සැලකෙන්නේ,

(1) ලෞරියා නන්ද නගර් ය. (2) රාම්පූර්වා ය.
(3) සාරානාත් ය. (4) සාංචිය ය.
(5) වෛශාලි ය. (.........)


**5.** යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් අතර 'දිගින් අඩි 17 ක් වන ගව රුව' දක්නට ලැබෙන ගුහාව වනුයේ,

(1) පොන්ඩිගෝම් ය. (2) ලැස්කෝ ය.
(3) ඇල්ටමීරා ය. (4) ෂෝවේ ය.
(5) කෝගුල් ය. (.........)


- ප්‍රශ්න අංක **6** සිට **10** තෙක් අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් ගැලපෙන පිළිතුර** අංක **1** සිට **9** තෙක් අංක කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


1



2



3


4


5


6


7


8


9

**6.** කඩොල්ගල්ල පරපුරේ සිත්තරුන් විසින් අඳින ලද සිතුවම කුමක් ද?

(1) **4** (2) **5** (3) **6** (4) **8** (5) **9** (.........)

**7.** ජාතක කථා තේමා **නොවන** සිතුවම් මොනවා ද?

(1) **4,5** (2) **5,6** (3) **6,7** (4) **7,8** (5) **7,9** (.........)

**8.** මැදවල විහාරයෙන් උපුටාගෙන ඇති සිතුවම් මොනවා ද?

(1) **1,3** (2) **2,3** (3) **3,4** (4) **4,5** (5) **5,6** (.........)

**9.** මේ අතරින් ලෙන් විහාර ආශ්‍රිත සිතුවම් ලෙස සැලකෙන්නේ මොනවා ද?

(1) **1,2,5** (2) **2,3,5** (3) **2,5,7** (4) **4,5,7** (5) **5,6,7** (.........)

**10.** මහනුවර සම්ප්‍රදායේ උඩරට ශෛලීය නිරූපිත සිතුවම් මොනවා ද?

(1) **1,2,3,7** (2) **2,3,4,7** (3) **3,4,5,6** (4) **4,5,6,9** (5) **5,6,7,8** (.........)

● ප්‍රශ්න අංක **11** සිට **15** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන පිළිතුර A, B, C, D, E** ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.



**A**



**B**



**C**



**D**



**E**

More Past Papers at
tamilguru.lk

**11.** **A** අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) වියුක්ත ඝනරූපී හැඩතල යොදාගත් චිත්‍රයකි.
(2) ඝන මාධ්‍ය භාවිතයෙන් කළ යථාරූපී සිතුවමකි.
(3) වර්ණ භාවිතයේ දී ශාස්ත්‍රාලයීය ශිල්පක්‍රම උපයෝගී කොට ගත් චිත්‍රයකි.
(4) වස්තූන්ගේ ප්‍රකෘති ස්වභාවය යථාරූපීව භාවිත කළ අවස්ථාවකි.
(5) ප්‍රකාශනයේ තීව්‍රතාව උදෙසා විසංගතව වර්ණ භාවිත කිරීමකි. (.........)

**12.** **B** අක්ෂරයෙන් දැක්වෙන චිත්‍රය නිර්මාණය කළ නාරායන ස්වාමි,

(1) කෝවිල් චිත්‍ර සඳහා බටහිර ශිල්පක්‍රම භාවිත කළේය.
(2) කතාන්දර කීමේ ක්‍රමවේදය අනුව චිත්‍ර නිර්මාණය කළේය.
(3) ස්වභාවිකත්වය නිරූපණය කිරීමට මුල්තැන දුන්නේය.
(4) වර්ණවලට වඩා රේඛාවට වැඩි අවධානයක් යොමු කළ කළේය.
(5) හින්දු සාහිත්‍යයේ එන සිද්ධි තත්ත්වාකාරයෙන් නිරූපණය කළේය. (.........)

**13.** **C** අක්ෂරයෙන් දැක්වෙන රිචඩ් ගේබ්‍රියල්ගේ සිතුවම,

(1) ආගමික කාර්යයක් සඳහා යන කාන්තාවන් පිළිබඳ විග්‍රහයකි.
(2) රූප හා වර්ණ නිරූපණාත්මකව හා සංකේතාත්මකව භාවිත කිරීමකි.
(3) තලය පුරා මනා වර්ණ සංගතතාවක් රැකගත් කෘතියකි.
(4) කාන්තාවන් දෙපිරිසක් අතර පුවතක් නිරූපණය කරන්නකි.
(5) යථාරූපී ස්වරූපය ශෛලිගතව නිරූපණය කිරීමකි. (.........)

**14.** **D** අක්ෂරයෙන් දැක්වෙන ජෙමිනි රෝයිගේ සිතුවම,

(1) දඩයම් සිද්ධියක් යථාර්ථවාදීව ඉදිරිපත් කිරීමකි.
(2) ඉන්දීය කලා ලක්ෂණ නිරූපිත කල්පිත ප්‍රකාශනයකි.
(3) ඉන්දීය ජන කලා ආභාසය අනුව කළ ශෛලීගත සංරචනයකි.
(4) ශිල්පියා තමාට ආවේනික ශෛලිය අනුව කළ නිර්මාණයකි.
(5) කල්පිතයක් වියුක්තරූපීව දැක්වීමට දැරූ උත්සාහයකි. (.........)

**15.** **E** අක්ෂරයෙන් දැක්වෙන කාන්තා රූපය,

(1) ශෝකාත්මක බව ප්‍රකාශ කෙරෙන ආලේඛ්‍ය චිත්‍රයකි.
(2) විමසුම් ස්වභාවය නිරූපිත ස්වභාවිකවාදී රෝම ආලේඛ්‍ය චිත්‍රයකි.
(3) රෝම ශිල්පියෙකු විසින් කළ ස්ත්‍රීත්වය පිළිබඳ තාත්වික ප්‍රකාශනයකි.
(4) රෝම ශිල්පියෙකුගේ ආලේඛ්‍ය චිත්‍ර කලාව පිළිබඳ නිදසුනකි.
(5) රූමත් තරුණ කාන්තාවක් පිළිබඳව කෙරෙන චිත්‍රමය විග්‍රහයකි. (.........)

[හතරවැනි පිටුව බලන්න.

- ප්‍රශ්න අංක **16** සිට **20** තෙක් ප්‍රශ්නවලට **වඩාත් යෝග්‍ය පිළිතුර** පහත සඳහන් **F, G, H, I, J** ලෙස නම් කර ඇති කැටයම් ඡායාරූප ඇසුරෙන් තෝරන්න.


F


G


H


I


J

**16.** **F** අක්ෂරයෙන් දැක්වෙන ඉසුරුමුණි කැටයම,

(1) ඇතුන්ගේ සරල හැඩතල කැටයම් කළ මහඟු නිර්මාණයකි.
(2) ජල ක්‍රීඩාවට සැරසෙන ඇතුන් නිරූපණය කිරීමට ගත් උත්සාහයකි.
(3) මහත් ආයාසයකින් යුතුව ඇතුන්ගේ චලන ඉරියව් යථාරූපීව නිරූපණය කිරීමකි.
(4) පිහිටි ගලේ ස්වභාවය උපයෝගි කරගනිමින් ඇතුන්ගේ චලන ඉරියව් නිරූපණය කිරීමකි.
(5) ඇතුන්ගේ නිසල ඉරියව් ස්වභාවික අයුරින් මතුකිරීමට ගත් උත්සාහයකි. (.........)

**17.** **G** අක්ෂරයෙන් දැක්වෙන සඳකඩපහණ,

(1) සංකල්පනාත්මකව නෙළන ලද අල්ප උන්නත පුවරු කැටයමකි.
(2) පඩිපෙළක් පාමුල යෙදූ කැටයම් කරන ලද පුවරුවකි.
(3) පොළොන්නරු ශිල්පියාගේ ප්‍රතිභාවේ මහිමය පෙන්වන කැටයමකි.
(4) අනුරාධපුර කැටයම් ශිල්පියාගේ කුසලතාව නිරූපිත නිර්මාණයකි.
(5) බුදු දහමේ විස්තර වන 'භව චක්‍රය' නිරූපණය කිරීමට ගත් උත්සාහයකි. (.........)

**18.** **H** අක්ෂරයෙන් දැක්වෙන ඉන්දීය භාරූත් කැටයමෙන්,

(1) ජේතවන භූමිය බුදුරදුන්ට පිදීම නිරූපණය කෙරෙයි.
(2) බුදුරදුන් වෙනුවට බෝධිය යොදාගත් අවස්ථාවක් දැක්වෙයි.
(3) භාරූත් ශිල්පියා සතු සිද්ධි නිරූපණය කිරීමේ හැකියාව පැහැදිලි කෙරෙයි.
(4) අනේපිඬු සිටාණන් බුදුරදුන් හමුවීම නිරූපණය කෙරෙයි.
(5) ජේතවනාරාමයේ බුදුරදුන් වැඩ සිටි අවස්ථාව නිරූපණය කෙරෙයි. (.........)

**19.** **I** අක්ෂරයෙන් දැක්වෙන ඉන්දු නිම්න මුද්‍රාවෙන් නිරූපණය වන්නේ,


(1) අං සහිත හිස්වැස්මක් පැළැඳි දෙවියෙකු වේ.
(2) වනයට හා සතුනට අධිපති දෙවියෙකු වේ.
(3) යෝගාසන ඉරියව්වෙන් සිටින යෝගාවචරයෙකු වේ.
(4) අං සහිත හිස්වැස්මක් පැළැඳි පශුපති වේ.
(5) ත්‍රිශූලයක් සහිත හිස්පළඳනාව පැළඳ සිටින ආගමික පූජකයෙකු වේ. (.........)

**20.** **J** අක්ෂරයෙන් දැක්වෙන කුලුනු කැටයම,

(1) ඉතා විසිතුරු ලෙස කැටයම් කරන ලද කොරින්තියන් කුලුනයි.
(2) කොරින්ත් නගරයේ බහුලව දක්නට ඇති කුලුනු වර්ගයයි.
(3) ඇතීනා දෙවොල තුළ දක්නට ඇති කුලුනු වර්ගයේ හිසයි.
(4) ග්‍රීසියේ පැරණිම කුලුනු වර්ගය වන ඩොරික් කුලුනයි.
(5) ග්‍රීසියේ බහුලව දක්නට ඇති අයොනික් කුලුනයි. (.........)

- ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන පිළිතුර** පහත සඳහන් **K, L, M, N, O** යනුවෙන් නම් කර ඇති කලා කෘති ඇසුරෙන් තෝරන්න.


K


L


M


N


O

**21.** **K** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) හින්දු ආභාසය මත ලෝකඩ වාත්තු ක්‍රමයට නිපද වූ ප්‍රතිමාවකි.
(2) මහාරාජ ලීලාවෙන් වැඩහිඳින රාජකීයයෙකුගේ පිළිරුවකි.
(3) අනුරාධපුර යුගයේ අවසාන භාගයට අයත් අවලෝකිතේශ්වර පිළිරුවකි.
(4) ලෝකඩ ඝන වාත්තු ක්‍රමයෙන් නිපදවා ඇති රන් ආලේපිත පිළිරුවකි.
(5) ලෝකඩ මාධ්‍යයෙන් වාත්තු කොට ඇති පද්මපානි බෝසත් රුවයි. (.........)

**22.** **L** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) දියුණු තාක්ෂණික ක්‍රමවේදයක් යොදාගෙන ඇති දැදිගමින් හමුවූ පහනකි.
(2) ක්‍රි.ව. 13-15 අතර කාලයට අයත් ලෝහමය ඇත් පහනකි.
(3) දැදිගමින් හමුවූ, එල්ලා තැබෙන අයුරින් නිර්මිත කලාත්මක ඇත් පහනයි.
(4) දියුණු තාක්ෂණයකින් හා කලාත්මක බවින් යුත් කොටවෙහෙර ඇත් පහනයි.
(5) ලෝහ වාත්තු ක්‍රමයට අනුව නිපදවා ඇති කලාත්මක ඇත් පහනකි. (.........)

**23.** **M** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) සැතපෙන ඉරියව්ව නිරූපිත පිහිටි ගලින් නෙළන ලද පිළිමයකි.
(2) පොළොන්නරුවේ ආලාහන පිරිවෙන් සංකීර්ණයට අයත් සැතපෙන පිළිමයයි.
(3) පල්ලව කලා ලක්ෂණ නිරූපණය වෙතැයි සැලකෙන පිළිමයකි.
(4) පැරකුම් රජ සමයේ නිර්මිත පොළොන්නරු ගල් විහාර සංකීර්ණයට අයත් සැතපෙන පිළිමයයි.
(5) විශිෂ්ට මූර්තිමය ලක්ෂණ නිරූපිත ගලින් කරන ලද පොළොන්නරු පිළිමයයි. (.........)

**24.** **N** අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) දුෂ්කර ක්‍රියාව ආධ්‍යාත්මිකව හා භෞතිකව ගෙනහැර දැක්වෙන කෘතියකි.
(2) බෝසතුන්ගේ දුෂ්කර ක්‍රියාව යථාරූපීව නිරූපණය කිරීමට ගන්ධාර ශිල්පියා ගත් වෑයමකි.
(3) ගන්ධාර ශිල්පියාගේ මාධ්‍ය භාවිතයට හා ශිල්පීය හැකියාවට කදිම නිදසුනකි.
(4) බෞද්ධ සාහිත්‍යයේ විස්තර කෙරෙන දුෂ්කර ක්‍රියාව යථාරූපීව නිරූපණය වූවකි.
(5) බෝසතුන්ගේ කෘශ වූ සිරුරේ ස්වභාවය ශෛලමය මාධ්‍යයෙන් නිරූපිත පිළිමයකි. (.........)

**25.** **O** අක්ෂරයෙන් පිළිබිඹු වනුයේ,
(1) ග්‍රීක සම්භාව්‍ය යුගයේ නිම වූ ශ්‍රේෂ්ඨ නිර්මාණයකි.
(2) පුනර්ජීවන යුගයේ බිහිවූ ශ්‍රේෂ්ඨතම කිරිගරුඬ මූර්තියයි.
(3) ප්‍රතාපවත් පුද්ගලයෙකු නිරූපණයට ගත් ප්‍රශස්ත වෑයමකි.
(4) හෙලනිස්ටික් යුගයේ විසූ ශ්‍රේෂ්ඨ මූර්ති ශිල්පියෙකුගේ මූර්තියකි.
(5) ජූලියස් පාප් වහන්සේගේ සොහොන් ගැබෙහි ඇති ප්‍රධාන මූර්තියයි. (.........)

- ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන පිළිතුර** තෝරන්න.

**26.** යුරෝපයේ පශ්චාත් උපස්ථිතිවාදය ආරම්භ වීමට හේතු වූ ප්‍රධානතම කාරණය කුමක්ද?
(1) වස්තු විෂයට වඩා හැඟීම් ප්‍රකාශනය ප්‍රබල බව සැලකීමයි.
(2) ආලෝකය හා අඳුර ත්‍රිමාන ලක්ෂණ දැක්වීම සඳහා යොදා ගැනීමයි.
(3) යථාරූපී ප්‍රකාශන පිළිවෙත චිත්‍ර කලාවේ ඉදිරි ගමනට බාධාවක් ලෙස සැලකීමයි.
(4) උපස්ථිතිවාදයේ සීමා රීතීන් අභිබවමින් නව මං කෙරෙහි නැඹුරු වීමයි.
(5) ස්වභාවිකත්වය නිරූපණයට වඩා කල්පිතයන් කෙරෙහි ශිල්පීන්ගේ නැඹුරුව වැඩි වීමයි. (.........)

[හයවැනි පිටුව බලන්න.

**27.** සාර්ථක කංචුක නිර්මාණයක දී වඩාත් වැදගත් වනුයේ,
(1) අන්තර්ගතයට ගැළපෙන අයුරින් වර්ණ, හැඩතල භාවිතය හා සැලසුම් කිරීමයි.
(2) මාතෘකාව සඳහා ගැළපෙන නිර්මාණාත්මක අක්ෂර භාවිත කිරීමයි.
(3) විවිධ තාක්ෂණික ක්‍රමවේද ගැළපෙන පරිදි ඇසුරු කොට ගැනීමයි.
(4) ගැළපෙන චිත්‍ර හා රූපසටහන් ආකර්ෂණීය ලෙස නිර්මාණය කිරීම ය.
(5) මුද්‍රණ තාක්ෂණයට අනුරූපව වර්ණ භාවිත කළ හැකි පරිදි නිම කිරීමයි. (.........)


**28.** චිත්‍රමය සංරචනයක් යනුවෙන් අර්ථ ගැන්වෙනුයේ,
(1) මනෝමය සංකල්පනාවක් විවරණය කෙරෙන වර්ණවත් ප්‍රකාශනයකි.
(2) කල්පිතයක් හෝ අත්දැකීමක් පදනම් කරගත් දෘශ්‍යමය ප්‍රකාශනයකි.
(3) වර්ණ, රේඛා, හැඩතල මාධ්‍යයෙන් කරනු ලබන තාත්ත්වික ප්‍රකාශනයකි.
(4) අලංකාර හැඩතලවලින් හා පැහැපත් වර්ණ මාලාවකින් යුතු ප්‍රකාශනයකි.
(5) කිසියම් තේමාවක් වින්දනාත්මකව හා නිර්මාණශීලීව ප්‍රකාශ කිරීමකි. (.........)

**29.** මුද්‍රණය සඳහා ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කිරීමේ දී වඩාත් වැදගත් වනුයේ,
(1) සරල හැඩතල හා සීමිත වර්ණ මාලාවක් යොදා ගැනීමයි.
(2) නිර්මිත මෝස්තර කොටස සෙසු කොටස් සමග සෑම පැත්තකින්ම සම්බන්ධ කිරීමයි.
(3) නිර්මාණශීලී හැඩතල භාවිතය හා සිත්ගන්නාසුලු වර්ණ යෙදීමයි.
(4) කොටු රටාවක් මත පිහිටා සමාන ඒකක ගණනාවකින් තලය පිරියන සේ ඇඳීමයි.
(5) යොදාගත් හැඩතල තුළ ශීත හා උෂ්ණ වර්ණ සංගතව යෙදීමයි. (.........)

**30.** නිශ්චල ද්‍රව්‍ය අධ්‍යයනයේ දී අපේක්ෂා කෙරනුයේ,
(1) මූලික සිද්ධාන්ත අනුව ද්‍රව්‍ය සමූහය අභිමත පරිදි ඇඳ, වර්ණ කර, නිම කිරීමයි.
(2) මූලික සිද්ධාන්ත භාවිත කරමින්, ගති ලක්ෂණ මතුවන පරිදි ඇඳ, වර්ණ කිරීමයි.
(3) ද්‍රව්‍ය සමූහයට අයත් වස්තූන් ත්‍රිමාණ ලක්ෂණ මතුවන අයුරින් ඇඳ, වර්ණ කිරීමයි.
(4) ද්‍රව්‍ය සමූහයේ අන්තර්ගත වස්තූන් නිවැරදිව ඇඳ, වර්ණ කිරීමයි.
(5) එක් එක් වස්තූන් වෙන වෙනම ඇඳ, ඒවායේ ස්වභාවය අනුව වර්ණ කිරීමයි. (.........)

● ප්‍රශ්න අංක **31** සිට **35** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** ඊට ඉදිරියෙන් දී ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් තෝරන්න.

**31.** මෙහි දැක්වෙන ගොඩනැගිල්ල,



(1) සුවිසල් ගල් තලාවක් මත ඉදිකර ඇති විහාරස්ථානයකි.
(2) භුවනෙකබාහු රජ දවස ගණේශ්වරාචාර්ය විසින් ඉදිකරන ලද්දකි.
(3) දකුණු ඉන්දීය වාස්තු විද්‍යා ලක්ෂණ අනුව ඉදිකරන ලද්දකි.
(4) බෞද්ධ හා හින්දු ආගමික මධ්‍යස්ථානයක් ලෙස ඉදිකරන ලද්දකි.
(5) ගම්පොළ යුගයේ දී ස්ථපතිරායර් ශිල්පියා විසින් ඉදිකරන ලද්දකි. (.........)

**32.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය,



(1) අනුරාධපුර රාජකීයයන් වෙනුවෙන් කළ ශෛලමය ජල තටාකයකි.
(2) අනුරාධපුර ශෛලමය පොකුණු අතර සුවිශේෂී නිර්මාණයකි.
(3) වාරි තාක්ෂණ නිපුණත්වය පෙන්වන අගනා ශෛලමය කලා නිර්මාණයකි.
(4) අභයගිරි විහාර භූමිය තුළ ඉදිකරන ලද ශෛලමය පොකුණු යුගලයකි.
(5) මනාව ඔපමට්ටම් කරන ලද ශෛලමය පුවරුවලින් කරන ලද්දකි. (.........)

**33.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය,



(1) රාජ රාජ චෝල තම මෙහෙසිය වෙනුවෙන් කළ, අංක 2 ශිව දෙවොලයි.
(2) කපා සැකසූ ගල් පුවරු යොදා කළ ශිව දෙවොලයි.
(3) පොලොන්නරුවේ හින්දු ආගමික ඊශ්වරම් දෙවොලකි.
(4) දකුණු ඉන්දීයානුවන් විසින් තම පුද පූජා සඳහා කළ දෙවොලකි.
(5) දකුණු ඉන්දීය චෝල වාස්තු විද්‍යා ලක්ෂණ නිරූපිත අංක 1 ශිව දෙවොලයි.

(.........)


**34.** මෙහි දැක්වෙන අජන්තා ගුහාව,



(1) චිත්‍ර ඇඳි ගුහා අතුරින් එකකි.
(2) චෛත්‍ය ශාලාවක අභ්‍යන්තර දසුනකි.
(3) විසිතුරු ලෙස සැකසූ විහාර ශාලාවකි.
(4) භික්ෂූන් වහන්සේලාගේ රැස්වීම් ශාලාවකි.
(5) අලංකාර කුලුනු සහිත වෘත්තාකාර ශාලාවකි.

(.........)


**35.** මෙහි දැක්වෙන දෙවොල,



(1) පාරාවෝ රජවරුන් උදෙසා ඉදිකරන ලද්දකි.
(2) ඊජිප්තුවේ ඉදිකළ දේවස්ථාන අතුරෙන් එකකි.
(3) හොරස් දෙවියන් උදෙසා කැපවූ එඩ්ෆු දෙවොලයි.
(4) ඇමෝන් හිරු දෙවියන් උදෙසා ඉදිකළ කාර්නැක් දෙවොලයි.
(5) නයිල් ගංගාධරයේ නැගෙනහිර ඉවුරේ පිහිටි ලක්සෝර් දෙවොලයි.

(.........)

- ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන පිළිතුර** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36.** මෙම සිතුවම,

(1) තීබස් හි සොහොන් ගැබකින් හමුවූවකි.
(2) ගීසා හි දෙවොලකින් සොයා ගැනුණකි.
(3) මධ්‍ය රාජධානි යුගයේ දී සිතුවම් වූවකි.
(4) අමර්නා හි සොහොන් ගැබකින් හමුවූවකි.
(5) පැරණි රාජධානි යුගයට අයත් එකකි.

(.........)

More Past Papers at
tamilguru.lk

**37.** මෙම සිතුවමෙහි තේමාව වී ඇත්තේ,

(1) වංශාධිපතියෙකුගේ තේජස හා බලපරාක්‍රමය ප්‍රකාශ කිරීමයි.
(2) පැපිරස් ගස් අතර දඩයමේ යෙදෙන රජෙකුගේ ක්‍රියාකාරකමකි.
(3) වංශාධිපතියෙකු සිය පවුලේ අය සමග ඔරුවක නැගී කුරුලු දඩයමේ යෙදීමයි.
(4) වංශාධිපති යුවලක් පරිසරයේ සුන්දරත්වය විඳින අවස්ථාවකි.
(5) වංශාධිපතීන් පිරිසක් පැපිරස් ගස් අතරින් ඔරු සවාරියක යෙදෙන අවස්ථාවකි. (.........)

**38.** මෙම සිතුවම සංරචනය කිරීමේ දී,

(1) පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ හා පරිමාණ රීති නොසලකා හැර ඇත.
(2) මානව රූප සහ සත්ත්ව රූප තලය පුරා විසිරී යන සේ නිරූපණය කර ඇත.
(3) තේමාවට උචිත අයුරින්, හැඩතල අතර සබඳතාව රැකෙන පරිදි, රූප ගළපා ඇත.
(4) ප්‍රධාන චරිතය සේම සෙසු චරිත ද විශාලත්වයෙන් යුතුව දක්වා ඇත.
(5) ස්වභාවික හා සාම්ප්‍රදායික හැඩතල තලය පුරා සමබරව ගළපා ඇත. (.........)

**39.** මෙම සිතුවම ඇඳීමේ දී හා වර්ණ ගැන්වීමේ දී,

(1) සාම්ප්‍රදායික රේඛාකරණයක් සහ වර්ණ රටාවක් අනුගමනය කර ඇත.
(2) සත්ත්ව රූප ස්වභාවිකව හා මානව රූප සාම්ප්‍රදායිකව සිතුවම් කර ඇත.
(3) ශීත වර්ණයට මුල් තැන දෙමින් රූප සවිස්තරාත්මකව ඇඳ ඇත.
(4) වර්ණ සහ රේඛා සමබර ආකාරයෙන් උපයෝගී කොට ගෙන ඇත.
(5) ශීත වර්ණ හා උෂ්ණ වර්ණ මනාව ගලපමින්, වර්ණ හා හැඩතල යොදා ඇත. (.........)

**40.** මෙම සිතුවම ගැන විමසීමේ දී,

(1) ශිල්පියා නිදහස් ප්‍රකාශනය හා පැවති සම්ප්‍රදාය අතර අතරමං වී ඇති අයුරු පෙනේ.
(2) ඊජිප්තු වංශාධිපතීන් හා සොබාදහම අතර පවත්නා අරගලය අනාවරණය වේ.
(3) ගහ කොළ, සතා සිව්පාවාට වඩා වංශාධිපතීන් බලවත් ය යන්න පැහැදිලි වේ.
(4) සුන්දර සොබාදහමේ අසිරිය වින්දනය කරන්නන් පිළිබඳව විවරණ කෙරෙයි.
(5) මිනිසාගේ කෙළිලොල් බවට සුන්දර සොබාදහම ගොදුරු වී ඇති අයුරු පෙනෙයි. (.........)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

## II කොටස

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* **'අ'** කොටසින් ප්‍රශ්න දෙකක් හා **'ආ'** සහ **'ඉ'** යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

## 'අ' කොටස
### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

**1.** යාපහුව යනු පර්වතයක් ආශ්‍රිතව නිමවා ඇති අලංකාර බලකොටුවකි.

(i) යාපහුවේ දක්නට ඇති වාස්තු විද්‍යා නිර්මාණයක් නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) මෙහි පඩිපෙළ දෙපස යොදා ඇති සිංහ රූප දෙක පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) සමස්ත යාපහු වාස්තු විද්‍යා නිර්මාණය තුළ කැටයම් කලාව අලංකරණ මාධ්‍යයක් සේ යොදා ගෙන ඇත. ඒ පිළිබඳව පහත සඳහන් ශීර්ෂ ඔස්සේ විමසීමක් කරන්න.

(අ) යොදා ගෙන ඇති කැටයම් වර්ග

(ආ) නිරූපිත අවස්ථා

(ඉ) භාවිත ශිල්පක්‍රම

(ඊ) කලාත්මක අගය (ලකුණු 8 යි.)

**2.** පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී පොලොන්නරුවේ ඉදි වූ තිවංක පිළිමගෙය අනර්ඝ කලාගාරයකි.

(i) තිවංක පිළිමගෙයි අන්තරාලය තුළ දක්නට ඇති සිතුවම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) "මෙම පිළිමගෙය තුළ යුග දෙකක චිත්‍ර දක්නට ඇත." කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) බෝධිසත්ත්ව සංකල්පය හා එය ප්‍රකාශ කිරීම සඳහා යොදාගෙන ඇති සංරචන ආකෘතිය 'දේවාරාධනාව' චිත්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 8 යි.)

**3.** ශ්‍රී ලංකාවේ ලෙන් විහාර අතර විශාලතම ලෙන් විහාරය වන දඹුලු ලෙන මහනුවර යුගයට අයත් චිත්‍ර, මූර්ති ගණනාවකින් යුතු කෞතුකාගාරයකි.

(i) දඹුලු විහාරයේ ලෙන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) 'දඹුලු විහාර සංකීර්ණය තුළ විවිධ ඉරියව් නිරූපිත බුදුපිළිම දක්නට ඇත.' කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) දඹුලු විහාරය තුළ දක්නට ඇති සුවිසල් වියන් සිතුවමක් වන 'මාර පරාජය' සිතුවම පිළිබඳ පහත සඳහන් ශීර්ෂ ඔස්සේ විග්‍රහයක් කරන්න.

(අ) ශිල්පීය දායකත්වය

(ආ) සංරචන ආකෘතිය

(ඉ) ප්‍රකාශනය

(ඊ) ශිල්පීය කුසලතාව (ලකුණු 8 යි.)

## 'ආ' කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

**4.** ආන්ද්‍රා දේශයේ පිහිටි අමරාවතිය යනු වාස්තු විද්‍යා, මූර්ති හා කැටයම් යන කලා අංගවලින් පිරි බෞද්ධ මධ්‍යස්ථානයකි.

(i) අමරාවතී ප්‍රදේශයෙන් හමුවන වෘත්තාකාර කැටයම් පුවරු **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) "අමරාවතී කැටයම් අතර බුදුන් වහන්සේ මානව ස්වරූපයෙන් දැක්වූ මෙන්ම **නොදැක්වූ** කැටයම් ද දක්නට ඇත." කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) බුද්ධ චරිතයේ වැදගත් අවස්ථා සතරක් නිරූපිත කැටයම් සහිත කුලුනක් හමුවී ඇත. එම අවස්ථා සතර විස්තර කර, ඒ එකිනෙකෙහි ආකෘතිය පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 8 යි.)

**5.** ඉන්දීය චිත්‍ර කලාවට අගනා මෙහෙවරක් ඉටු කළ ශිල්පීන් තමන්ට අනන්‍ය වූ ශෛලීන් ඔස්සේ එරට චිත්‍ර කලා සම්ප්‍රදාය පෝෂණය කර ඇත.

(i) රාජා රවි වර්මාගේ නිර්මාණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) නවජීවන ව්‍යාපාරයේ ශිල්පියෙකු වූ නන්දලාල් බෝස්ගේ චිත්‍ර පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) "අම්රිතා ශෙර්ගිල්, තම චිත්‍ර මගින් ඉන්දීය ජන ජීවිතය පිළිබඳ විග්‍රහයක යෙදෙයි." මෙම ප්‍රකාශය පහත දැක්වෙන ශීර්ෂ ඔස්සේ විමසන්න.

(අ) ආභාසය

(ආ) වස්තු විෂය

(ඉ) ශෛලීය ලක්ෂණ

(ඊ) වර්ණ භාවිතය (ලකුණු 8 යි.)

## 'ඉ' කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

**6.** 20 වැනි සියවසේ යුරෝපයේ බිහිවූ 'ඝනිකවාදය' විප්ලවීය වෙනසක් ඇති කළ කලා සම්ප්‍රදායකි.

(i) පිකාසෝගේ මුල් අවධියේ නිර්මාණ යුග දෙකකට බෙදා දැක්විය හැකිය. එම යුග **දෙක** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) පිකාසෝගේ නිර්මාණ කාර්යය කෙරෙහි අප්‍රිකානු නීග්‍රෝ මූර්ති මගින් ඇති කළ බලපෑම පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) පිකාසෝගේ ඝනිකවාදී සිතුවම් අතර සංස්ලේෂණවාදී හා විශ්ලේෂණවාදී කෘති දැකිය හැකිය. ඒ පිළිබඳව උදාහරණ සහිතව විමසීමක් කරන්න. (ලකුණු 8 යි.)

**7.** ග්‍රීකයෝ පුරාණයේ සිටම මූර්ති, වාස්තු විද්‍යා සහ මැටි බඳුන් කර්මාන්තය යන ක්ෂේත්‍රයන් හි විශිෂ්ටයෝ වූහ.

(i) ග්‍රීසියේ පෞරාණික යුගයට අයත් මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) ග්‍රීසියේ පාතිනොන් දේවස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) ග්‍රීසියේ ප්‍රචලිතව පැවති මැටි බඳුන් කර්මාන්තය පිළිබඳ පහත සඳහන් ශීර්ෂ ඔස්සේ විමසීමක් කරන්න.

(අ) භාවිත කිරීමේ අරමුණු

(ආ) බඳුන් තනාගත් අයුරු

(ඉ) සැරසිලි කිරීමේ ශිල්ප ක්‍රම

(ඊ) කලාත්මක අගය

(ලකුණු 8 යි.)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

චිත්‍ර කලාව II
சித்திரக்கலை II
Art II

51 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් අධ්‍යයනය කිරීම සඳහා යොදාගන්න.**

**උපදෙස්:**
- ඔබේ **විභාග අංකය,** ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලි ව ලියන්න.
- ඔබ වෙත සපයා ඇති විශේෂ **ඇඳීමේ කඩදාසිය** (Drawing paper) වර්ණ චිත්‍රය ඇඳීම සඳහා භාවිත කරන්න. වෙනත් කිසිම චිත්‍රයක් හෝ අධ්‍යයන සටහනක් ඇඳීම අවශ්‍ය නොවේ.
- ඔබගේ චිත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය සම්පූර්ණයෙන්ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසිදායක විය හැකි ය.

**ස්වභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය**

පහත සඳහන් උපදෙස් සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය ඇඳ, වර්ණ කරන්න.

✳ කඩදාසියේ තලය, අර්ථවත් ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.

✳ ද්‍රව්‍යයන්ගේ ගතිලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳ ව සැලකිලිමත් වන්න.

✳ ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ, ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.

✳ වර්ණ මාධ්‍යය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත් ව භාවිත කරන්න.

✳ ද්‍රව්‍ය සමූහයට ගැළපෙන පරිදි වර්ණවත් පසුබිමක් යොදන්න.

✳ ද්‍රව්‍ය සමූහය තබා ඇති ධාරකයේ (ලෑල්ලේ) පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස් කරගැනීමට හැකි ය.

✳ දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මාධ්‍ය කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.

✳ ✳ ✳

More Past Papers at
tamilguru.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

චිත්‍ර කලාව III
சித்திரக்கலை III
Art III

51 S III

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්නය තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** හා තෝරාගත් **ප්‍රශ්න අංකය** ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලි ව ලියන්න.
* දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මෙම මාධ්‍යයන් කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.
* අවශ්‍ය අයට විෂු කඩදාසි සපයනු ලැබේ.
* චිත්‍රය භාර දෙන විට, එය සම්පූර්ණයෙන්ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසිදායක විය හැකි ය.

● පහත සඳහන් 'අ', 'ආ' සහ 'ඉ' යන කොටස් තුන අතුරෙන් **එක්** මාතෘකාවක් පමණක් තෝරාගෙන, වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

**'අ' කොටස - චිත්‍ර සංරචනය**

1. තදබදයක් පවතින එළවලු තොග වෙළඳපොළක්
2. 'සුන්දර දොළ පාරක අසිරිය දිය නාන පිරිස නිසා තවත් වැඩිවෙලා.'
3. වාරකන් දිනක වෙරළේ තනි වූ බෝට්ටු / අනතුරක් ඉව වැටුණු මුව රංචුවක්

**'ආ' කොටස - මෝස්තර නිර්මාණය**

4. පිච්ච මල වියුක්තරූපීව යොදාගනිමින් චිත්ත රෙද්දක් සඳහා මුද්‍රණය කිරීමට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් 9″ × 9″ (අඟල්) ප්‍රමාණයේ අවකාශයක් තුළ නිර්මාණය කරන්න. (මූලික මෝස්තර ඒකකය සහ සෙසු කොටස් අතර අන්තර් සම්බන්ධය පැවතීම අපේක්ෂා කෙරේ.)
5. සමාන පැති අටක් සහිත කාන්තා කුඩයකට සුදුසු මෝස්තරයක්, මධ්‍ය කේන්ද්‍ර කොටගෙන විහිදී යන සේ නිදහස් හැඩතල භාවිතයෙන් නිර්මාණය කරන්න.
6. ජාතික උත්සව අවස්ථාවක් සඳහා යොදාගත හැකි 9'× 4' (අඩි) ප්‍රමාණයේ ධජ පතාකයක් පාරම්පරික සැරසිලි භාවිතයෙන් නිර්මාණය කරන්න. (ධජයේ මූලික හැඩය පරිමාණයට අනුකූලව තලයට ගැලපෙන සේ කුඩා කරගන්න.)

**'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය**

7. 'ජාතියක් වශයෙන් එක්ව වසංගතයකට මුහුණ දෙන ආකාරය' පිළිබඳව, පුවත්පතක පළ කෙරෙන විශේෂාංග ලිපියකට සුදුසු වර්ණවත් සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.
8. 'ස්වයංපෝෂිත රටක්' යන තේමාව යටතේ ගෙවතු වගාවේ අගය පැහැදිලි කෙරෙන විචිත්‍රවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
9. දේශීය නිෂ්පාදනයක් ලෙස මිශ්‍ර පලතුරු එකතුවක් (අච්චාරු) ඇසුරුම් කෙරෙන වීදුරු භාජනයක පිටත පෘෂ්ඨයේ ඇලවීම සඳහා ලේබලයක් නිර්මාණය කරන්න. (යෝජිත නාමයක් හා රූපසටහන් ඇතුළත් කරන්න.)

***